# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන)

**1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2022 අගෝස්තු මස 31 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 අගෝස්තු මස 10 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[145 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය* :** මේ වගන්තිය මගින් 1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 5අ වගන්තිය සංශෝධනය කරනු ලබන අතර එම සංශෝධනයේ නීතිය බලපෑම වනුයේ සුළු හිමිකම් අධිකරණවලින් ලැබෙන අභියාචනා විභාග කිරීම සඳහා පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත හැකියාව ලබාදීම වේ.

එල්. ඩී.—ඕ. 62/2021

**1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** (1) මේ පනත 2022 අංක        දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

1990 අංක 19 දරන පනතේ 5අ වගන්තිය සංශෝධනය කිරීම

**2.** 1990 අංක 19 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ 5අ වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "යම් දිසා අධිකරණයක් හෝ පවුල් අධිකරණයක්" යන වචන වෙනුවට "යම් දිසා අධිකරණයක්, පවුල් අධිකරණයක් හෝ සුළු හිමිකම් අධිකරණයක්" යන වචන ආදේශ කිරීමෙන් සහ "යම් දිසා අධිකරණයක් හෝ පවුල් අධිකරණයක්" යන වචන වෙනුවට "යම් දිසා අධිකරණයක්, පවුල් අධිකරණයක් හෝ සුළු හිමිකම් අධිකරණයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (2) වන උපවගන්තියේ "දිසා අධිකරණයක හෝ පවුල් අධිකරණයක" යන වචන සඳහන් වන කවර වූ තැනක "දිසා අධිකරණයක, පවුල් අධිකරණයක හෝ සුළු හිමිකම් අධිකරණයක" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ පැති සටහනෙහි "දිසා අධිකරණවලින් සහ පවුල් අධිකරණවලින්" යන වචන වෙනුවට "දිසා අධිකරණවලින්, පවුල් අධිකරණවලින් සහ සුළු හිමිකම් අධිකරණවලින්" යන වචන ආදේශ කිරීමෙන්.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.